


# ජාතික අවයව දන්දීමේ කාඩ්පතක් ලබා ගැනීම තොරතුරු/උපදෙස් පත්‍රිකාව

## 1. මරණයෙන් පසු (මොළයේ මරණය) මගේ අවයව පරිත්‍යාග කිරීමට ලියාපදිංචි වන්නේ කෙසේද?

a. ඉන්ද්‍රිය පරිත්‍යාගශීලියෙකු ලෙස ලියාපදිංචි වීමට ඇති හොඳම ක්‍රමය නම් පහත සඳහන් ආකෘති පත්‍ර බාගත කර, මුද්‍රණය කර, සම්පූර්ණ කර, පහත සඳහන් ලිපිනයට තැපෑලෙන් එවීමයි.

**සෞඛ්‍ය තොරතුරු සහ පර්යේෂණ ඒකකය,**
**ශික්ෂණ රෝහල,**
**පේරාදෙණිය.**

(මෙහිදී සාක්ෂිකරුවන්ගේ විස්තර සහ අත්සන් සම්පූර්ණ කර තිබීම ලියාපදිංචි වීමේ පත්‍රිකාවේ නීතිමය වලංගු භාවය සඳහා අනිවාර්ය වේ)
සිංහල අයදුම්පත: බාගත කරන්න

b. තවද **පේරාදෙණිය** රෝහලේ **සෞඛ්‍ය තොරතුරු සහ පර්යේෂණ ඒකකය** වෙත පැමිණීමෙන්ද ඔබට ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍ර ලබාගෙන, පුරවා නැවත භාරදිය හැකි අතරම **පේරාදෙණිය ශික්ෂණ රෝහල් වෙබ් අඩවියට පිවිස** බාගත කරගත හැක.

## 2. මා නිවසේදී මිය ගියහොත් මාගේ අවයව පරිත්‍යාග කළ හැකිද?

a. නැත. ඔබේ අවයව පරිත්‍යාග කළ හැක්කේ ඔබ දැඩි සත්කාර ඒකකයකදී, පළපුරුදු වෛද්‍ය මණ්ඩලයක් මගින් ' මොළයේ මරණය' හඳුනාගත් විට පමණි

b. **මොළයේ මරණය** යනු මොළයට සිදුවන දැඩි හානියක් හේතුවෙන් පුද්ගලයෙකුගේ මොළය තව දුරටත් ක්‍රියාකාරී නොවීමයි. හුස්ම ගැනීම ඇතුළු අනෙකුත් ජීව ක්‍රියා පවත්වා ගැනීමේ හැකියාව ඔවුන්ට ස්ථිරවම අහිමි වී ඇති නිසා ඒ සියල්ලක්ම සිදු කෙරෙනු ලබන්නේ දැඩි සත්කාර ඒකකයේ ඇති යන්ත්‍ර මගිනි. සැමවිටම විශේෂ වෛද්‍ය මණ්ඩලයක් විසින් දැඩි සත්කාර ඒකකයකදි පමණක් මොළයේ මරණය හඳුනා ගනු ලැබේ.

## 3. යම් රෝගී තත්වයන් ඇති අයෙකුට අවයව පරිත්‍යාග කරන්නෙකු වීමට හැකිද?

a. ඔව්, එසේ ලියාපදිංචි විය හැකි නමුත් මොළයේ මරණයකදි වෛද්‍යවරුන් අවයව ලබාගෙන බද්ධ කිරීමට සුදුසුද යැයි නැවත සලකා බලනු ඇත. ඔබේ අවයව බද්ධ කිරීම සඳහා නුසුදුසු වුවත්, අවශ්‍යතා ඇති අනෙක් අයට උපකාර කිරීම සඳහා ඇතැම් පටක තවමත් බද්ධ කළ හැකි බව මතක තබා ගන්න.

## 4. මරණයෙන් පසු අවයව පරිත්‍යාග කරන්නෙකු වීමට වයස් සීමාවක් තිබේද?

a. ශ්‍රී ලංකාවේ දැනට පවතින නීතියට අනුව, මරණයෙන් පසු ඔබේ අවයව පරිත්‍යාග කිරීමට ඔබට අවම වශයෙන් වයස අවුරුදු 21 ක් විය යුතුය. කෙසේ වෙතත් සුදුසු නීති සම්මත වුවහොත් තවත් පරිත්‍යාගශීලීන් ඇතුළත් කිරීම සඳහා මෙම වයස් සීමාව අනාගතයේදී වෙනස් විය හැකිය.

b. ඉහළ වයස් සීමාවක් නැත. වයසට යන විට අපේ අභ්‍යන්තර අවයව සියල්ලම දුර්වල වේ. එම නිසා, දුර්වල අවයව බද්ධ කළහොත්, අවයව ලබාගන්නා පුද්ගලයාට එමගින් ලැබෙන සුවය අවම වේ. සාමාන්‍යයෙන් අවයව පරිත්‍යාග කිරීම සඳහා වයස අවුරුදු 75 ට වැඩි අය එතරම් සුදුසු නැත.

**5. අවයව ලබා ගැනීමට පෙර මා මිය ගොස් ඇති බවට වෛද්‍යවරුන් සහතික කරන්නේ කෙසේද?**

a. ඔබට ඉන්ද්‍රිය පරිත්‍යාගශීලියෙකු විය හැක්කේ විශේෂ වෛද්‍යවරුන් මණ්ඩලයක් මගින් ඔබ මියගිය බව සනාථ කිරීමෙන් පසුව පමණි. මොළයේ මරණය සනාථ කිරීම සඳහා අනුගමනය කළ යුතු ලොව පිළිගත් නීත්‍යානුකූල මාර්ගෝපදේශ ලංකාවේද භාවිතා කෙරේ.

**6. මගේ මරණයෙන් පසු ඉන්ද්‍රිය පරිත්‍යාග නිසා මෘත ශරීරය විකෘති වීමක් සිදු විය හැකිද?**

a. ඉන්ද්‍රිය ලබා ගැනීම සිදු වන්නේ විශේෂ පුහුණුවක් ලත් ශල්‍ය වෛද්‍ය කණ්ඩායමක් මගින් ශල්‍යාගාරයක් තුළ සිදු කරන සැත්කමක් මගින් නිසා ශරීරය විකෘති නොවේ.

b. මරණය සිදු වූ වේලාව ලෙස සලකන්නේ 'මොළයේ මරණය' තහවුරු කිරීමේ වේලාව බැවින්, ඉන්ද්‍රිය පරිත්‍යාගයෙන් පසුව මෘත ශරීරය නැවත භාර දීමට ප්‍රමාද නොවනු ඇත.

c. අවමංගල්‍ය කටයුතු වෙනස් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති අතර ඔබේ ආගම/ විශ්වාසයන්ට අනුව එය පැවැත්විය හැකිය.

**7. අවයව ඉවත් කිරීම නිසා වේදනාවක් ඇති විය හැකිද?**

a. නැත. යමෙකුගේ මොළය ක්‍රියා විරහිත වූ පසු (මොළය මිය ගොස්), ඔවුන්ට වේදනාව ඇතුළුව කිසිදු සංවේදනයක් දැනෙන්නේ නැත.

**8. මගේ අවයව බද්ධ කෙරුණු රෝගීන්ගේ විස්තර මාගේ පවුලේ සමාජිකයින්ට දැනගත හැකිද?**

a. නොහැක. එය ඉතා සංවේදී කාරණයක් බැවින් එම නම්/ගම් හෙළිදරව් කිරීම සදාචාර විරෝධීය.

b. අවයව ලබන රෝගියාගේ පාර්ශවය, ඉන්ද්‍රිය පරිත්‍යාග කරන ලද තැනැත්තාගේ පාර්ශවය අතර කිසිදු තොරතුරු හුවමාරුවක් සිදු නොවේ.

**9. මරණයෙන් පසු ( මොළයේ මරණය) අවයව පරිත්‍යාග කිරීමට මා ගත් තීරණයට ලියාපදිංචි කිරීමෙන් පසු සිදුවන්නේ කුමක්ද?**

a. ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍රය අප වෙත එවූ පසු, ඔබගේ ලියාපදිංචිය තහවුරු කිරීම සඳහා ජාතික ඉන්ද්‍රිය දන්දීමේ කාඩ්පතක් ලැබෙනු ඇත.

b. ඊට අමතරව, ඔබ ලබා දී ඇති තොරතුරු, ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය (ජාතික හැඳුනුම්පත) යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ මධ්‍යම දත්ත ගබඩාවක සුරක්ෂිතව ගබඩා කරනු ඇත.

c. අවාසනාවන්ත සිදුවීමකින් පසු ඔබ කිසියම් රජයේ රෝහලකට ඇතුලත් කර මොළයේ මරණයක් ඇති බව හඳුනාගත හොත්, රෝහල් කාර්යය මණ්ඩලය ඔබේ ජාතික හැඳුනුම්පත් අංකය මගින් ඔබේ ලියාපදිංචිය පරික්ෂා කරනු ඇත.

d. එහිදී ලියාපදිංචිය සනාථ වුවහොත්, ඔවුන් ඔබේ සමීපතම ඥාතියා සම්බන්ධ කරගෙන ඔහුගේ හෝ ඇයගේද කැමැත්ත ඇතිව ඉන්ද්‍රිය පරිත්‍යාගය සඳහා අවශ්‍ය ක්‍රියාවලිය ආරම්භ කරනු ඇත.

**10. ජාතික අවයව දන්දීමේ කාඩ්පතක් හිමි කෙනෙකු යම් හෙයකින් මොළය මිය යාමකට ලක් වුවහොත් වෛද්‍යවරුන්ට ඔහුගේ/ ඇයගේ අවයව ලබා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කළ හැකිද?**

a. සැමවිටම ඔවුන් ඔබේ සමීපතම ඥාතියා සම්බන්ධ කරගෙන ඔහුගේ/ ඇයගේ කැමැත්ත ඇතිව පමණක් ඉන්ද්‍රිය පරිත්‍යාගය සඳහා අවශ්‍ය ක්‍රියාවලිය ආරම්භ කරනු ඇත. මෙම කාඩ්පත, එම කැමැත්ත ලබා ගැනීමේ ක්‍රියාවලිය පහසු කරනු ඇත.

b. යම් හෙයකින් මෙම කාඩ්පත ඔබ සතු නොවුනද ඔබගේ අවයව දන්දීමේ කැමැත්ත පිළිබඳව සමීපතම ඥාතීන් දැනුවත් කර තිබුණහොත් මෙම ක්‍රියාවලිය පහසු වනු ඇත.




## මරණයෙන් පසුව අවයව පරිත්‍යාග කිරීම සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීම

අවයව අක්‍රියතාවයකින් පෙළෙන පුද්ගලයෙකුට බද්ධ කිරීම සඳහා මාගේ මරණයෙන් පසුව අවයව පරිත්‍යාග කිරීම සඳහා මෙයින් කැමැත්ත ප්‍රකාශ කර සිටිමි.

(කැමැත්ත ප්‍රකාශ කිරීමට පෙර සපයා ඇති තොරතුරු පත්‍රිකා හොඳින් කියවා බලන්න)

නම: ..........................................................

ස්ත්‍රී ☐ පුරුෂ ☐ ලේ වර්ගය ......................................

ජාතික හැඳුනුම්පත් අංකය: ..........................................................

ස්ත්‍රී ☐ පුරුෂ ☐

ලිපිනය: ..........................................................

දුරකතන අංක: .............................. විද්‍යුත් තැපැල (Email) ..............................

ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාසය: ..........................................................

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය: ..........................................................

දිස්ත්‍රික්කය: ..........................................................

**හදිසි අවස්ථාවකදී දැනුම්දිය යුතු පුද්ගලයෙකුගේ තොරතුරු**

නම: ..........................................................

ලිපිනය: ..........................................................

දුරකථන අංක: ..........................................................

ඥාතීත්වය: ..........................................................

පහත සඳහන් අවයව වලින් ඔබ පරිත්‍යාග කිරීමට කැමති අවයව සඳහා ✓ ලකුණ යොදන්න.

- වකුගඩු ☐
- අක්මාව ☐
- හදවත ☐
- පෙනහළු ☐
- අග්න්‍යාශය / ඇල දිව ☐
- අන්ත්‍ර/බඩවැල් ☐
- ඇස් ☐
- පටක වර්ග (අස්ථි, බණ්ඩරා ආදිය) ☐

මෙම ප්‍රකාශය මරණයෙන් පසුව අවයව ලබා දීම සඳහා ස්වකැමැත්තෙන්ම කරන ලද ප්‍රකාශයක් බවට සහතික කරමි.

............................................ ..................................................

දිනය අත්සන

| සාක්ෂිකරු | ජාතික හැඳුනුම්පත් අංකය | අත්සන |
|---|---|---|
| 1. ........................... | ........................... | ..................... |
| 2. ........................... | ........................... | ..................... |